# නූතන සිංහල කෙටිකතාවේ කලාත්මක ලක්ෂණ
## (1924 සිට 1990 දක්වා)

සිංහල දර්ශනපති උපාධිය සඳහා
කොළඹ විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කෙරෙන
නිබන්ධනය යි.

UCLIB
518031
University of Colombo Library Sri Lanka

ආර්. එම්. එස්. එන්. රත්නායක.
**94/M. Phil./98.**
ශාස්ත්‍රවේදී (සිංහල)
විද්‍යාපති (පුස්තකාල හා විඥාපන විද්‍යා)
ජූලි 2000.

## සාරාංශය

මේ නිබන්ධනයෙහි පළමු පරිච්ඡේදයෙහි අරමුණ වන්නේ විවිධ විචාරකයන් විසින් කෙටිකතා මාධ්‍යය සම්බන්ධයෙන් පළ කෙරුණු අදහස් ඇසුරෙන් මේ සුවිශේෂ මාධ්‍යය හඳුන්වාදීම ය.

එම අදහස් පසුබිමෙහි තබාගෙන වස්තු විෂය, කථා වින්‍යාසය, සිද්ධි නිරූපණය, චරිත නිරූපණය, ධාරණාවේ ඒකත්වය හා භාෂාව හා අනෙකුත් උපක්‍රම යනාදී අංග සම්බන්ධයෙන් සිංහල කෙටිකතාකරුවා කෙතරම් දුරට සැලකිලිමත් විණි ද යන්න පරිච්ඡේද සයක් යටතේ විමසුමට ලක් කිරීම මේ පර්යේෂණයෙහි අරමුණ වෙයි.

"වස්තු විෂය" පරිච්ඡේදය යටතේ සාකච්ඡා කැරෙනුයේ සිංහල කෙටිකතාකරුවා වස්තු විෂය තෝරා ගැනීමේ දී කෙටිකතා මාධ්‍යයේ සීමාවන් පිළිබඳ කෙතෙක් දුරට සැලකිලිමත් වී ද යන්න ය. කෙටිකතාකරුවාට ඕනෑම කරුණක් සිය කෙටිකතාව සඳහා උපයෝගී කර ගත හැකි මුත් එහිදී සිය මාධ්‍යයේ සුවිශේෂතාව හා සීමාවන් පිළිබඳ සැලකීමට සිදුවේ. මේ සම්බන්ධයෙන් සිංහල කෙටිකතාකරුවා කෙතෙක් දුරට සැලකිලිමත් වී ද යන්න මේ පරිච්ඡේදයෙන් විමසුමට ලක් කෙරේ.

නවකතා නිර්මාණයේ දී නම් අත්‍යවශ්‍ය වූ සිදුවීම් හා චරිත තෝරා ගැනීම එතරම් ම බරපතල කාරණයක් නොවිය හැකි මුත් කෙටිකතාවක් නිර්මාණයේ දී සිය මූලික අභිප්‍රායට අදාළ වන සිදුවීම් හා චරිත ඉතා පරෙස්සමින් තෝරාගැනීම බෙහෙවින් වැදගත් වේ. මෙසේ තෝරාගන්නා ලද සිදුවීම් කිසියම් තර්කානුකූල හේතු ඵල සම්බන්ධයක් අනුව එක්තරා පිළිවෙළකට ඉදිරිපත් කිරීම කථා වින්‍යාසය නම්. මෙම නිබන්ධනයෙහි "කථා වින්‍යාසය" නමැති පරිච්ඡේදයෙන් විමසුමට ලක් කැරෙන්නේ සිංහල කෙටිකතාකරුවා මේ ලක්ෂණය කෙරෙහි කෙතෙක් දුරට සැලකිලිමත් වී ද යන්න යි.

සෑම කෙටිකතාකරුවකු ම පාහේ එක් සිදුවීමක් හෝ සිදුවීම් කීපයක් සිය කෙටිකතාව සඳහා උපයෝගී කරගෙන ඇති බව පෙනේ. මෙහි දී සිය අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා අත්‍යවශ්‍ය සිදුවීම් පමණක් තෝරා බේරා ගැනීමේ අභියෝගයට මුහුණ දීමට ඔහුට සිදු වේ. සිංහල කෙටිකතාකරුවන් මෙසේ අත්‍යවශ්‍ය සිදුවීම් තෝරාගැනීම සම්බන්ධයෙන් කෙතරම් සැලකිලිමත් වූවා ද යන්න සිද්ධි නිරූපණය නමැති පරිච්ඡේදයෙහි විග්‍රහ කෙරේ.

කෙටිකතාවේ චරිත නිරූපණයට වඩා සිද්ධි නිරූපණය වැදගත් සේ ඇතැම් විචාරකයන් අතින් සැලකුණ ද චරිත නිරූපණය ද කෙටිකථාවේ සාර්ථකත්වයට බලපාන තීරණාත්මක සාධකයක් බව බොහෝ කෙටිකතා විමසන විට පෙනී යේ. ඒ අනුව සිංහල කෙටිකතාව ප්‍රධාන චරිත එකක හෝ කීපයක ඇතැම් චරිතාංග ඉස්මතු කිරීම, එක ම චරිතයේ පරස්පර ලක්ෂණ දෙකක් ඉස්මතු කිරීම, එක් ප්‍රධාන චරිතයක එක් චරිතාංගයක් හෙළි කිරීම, චරිත කිහිපයකට පොදු එක් චරිතාංගයක් හෙළි කිරීම, පරස්පර විරෝධී චරිත දෙකක චරිතාංග නිරූපණය, ගැටුමක් තුළින් චරිතයක් හෝ චරිත කීපයක් හෙළිදරව් වන්නට ඉඩ හැරීම, චරිත දෙකක් ගැටෙන්නට සැලැස්වීම තුළින් චරිත නිරූපණය හා සියුම් ඉඟි කිරීම් මඟින් චරිත නිරූපණයක යෙදීම යනාදී විවිධ උපක්‍රම මඟින් සාර්ථක වූ හා අසාර්ථක වූ අවස්ථා පිළබඳ ව විමසුමක යෙදීම "චරිත නිරූපණය" නමැති පරිච්ඡේදයෙහි අභිප්‍රාය වී ඇත.

නවකතාව හා සසඳන විට කෙටිකතාවේ ප්‍රධානතම විශේෂ ලක්ෂණය වන්නේ "ධාරණාවේ ඒකත්වය" යැ යි බොහෝ විචාරකයන් අතින් පිළගැනේ. කෙටිකතාව තුළ කෙතරම් සිදුවීම් සංඛ්‍යාවක් හෝ චරිත සංඛ්‍යාවක් අඩංගු වුව ද ඒ සියල්ල එක් මූලික අභිප්‍රායකින් බැඳී තිබීම අත්‍යවශ්‍ය සේ සැලැකේ. මෙම ලක්ෂණය කෙරෙහි සිංහල කෙටිකතාකරුවන් කෙතරම් දුරට සැලකිලිමත් වූවා ද යන්න විමසීම "ධාරණාවේ ඒකත්වය" නමැති පරිච්ඡේදයෙහි අරමුණ වේ.

"භාෂාව හා අනෙකුත් උපක්‍රම" නම් වූ අවසන් පරිච්ඡේදයෙහි සාකච්ඡා කෙරෙනුයේ අනෙකුත් පරිච්ඡේදයන් හි විමසුමට ලක් නොවූ සිංහල කෙටිකතාවේ භාෂාව, පරිසර වර්ණනා හා සංකේත භාවිතය එම කෙටිකතාවලට ආලෝකයක් වූ සැටි කෙටියෙනි.

1924 වර්ෂයේ පටන් 1990 දක්වා බිහි වූ සිංහල කෙටිකතා ග්‍රන්ථ විමසන විට පෙනී යනුයේ කෙටිකතා මාධ්‍යයට සුවිශේෂ වූ ලක්ෂණ කෙරෙහි සිංහල කෙටිකතාකරුවන් එතරම් දුරට සැලකිලිමත් වී නොමැති බව යි. එහෙත් කෙටිකතාව සුවිශේෂ මාධ්‍යයක් කොට සලකමින් එහි විශේෂ ලක්ෂණ ගැන සැලකිලිමත් ව රචනා කරන ලද කෙටිකතා ද අතලොස්සක් හෝ නැත්තේ නොවේ.